
# බුදු වදනින් යහපත් ජන සමාජයකට



පඤද්ඤදා වන්තස්ස අයං ධම්මො
නායං ධම්මො දුප්පඤද්ඤදස්ස

මාගේ මේ ධර්‍මය දුෂ්පාඥයින්ට හෙවත් ප්‍රඥාව නැති අයට නොව ප්‍රඥාවන්තයින්ටය යන බුදු වදන අනුව අප විසින් බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවලදී දේශනා කරන ලද දහම් කරුණු ඇසුරින් අපගේ ජීවිතවල ඇති වැරදි තැන් වටහා ගෙන දිවිමග සරුකර ගැනීමට උත්සාහ ගනිමු. එමගින් යහපත් ජන සමාජයක් ගොඩනැගෙනු ඇත.

බුදුරජාණන් වහන්සේ දේශණා කරන ලද පහත සඳහන් ගාථා කිහිපය ගැන සලකා බලමු.

නහජේ පාපකෙ මිත්තේ - නහජේ පුරිසාධමෙ
භජේථ මිත්තෙ කල්‍යාණෙ - භජේථ පුරිසුත්තමෙ

පාප මිත්‍රයන් හෙවත් අනුවණ මිත්‍රයන් ඇසුරු නොක-රන්න. අධම හෙවත් අධර්මිෂ්ඨ මිත්‍රයන් ඇසුරු නොකරන්න. කල්‍යාණ හෙවත් යහපත් මිත්‍රයන් ඇසුරු කරන්න උතුම් සත් ගුණවත් මිනිසුන් ඇසුරු කරන්න යනු මෙහි අදහසයි.

ඉහත සඳහන් බුදු වදන අපගේ ජීවිත සකස් කර ගැනීමේලා කොතරම් උපකාරී වෙනවද ? අද සමාජය දෙස බලන කල පාපමිත්‍ර සේවනය නිසා කොතරම් ජනයා තමාගේ ජීවිත අකාලයේ විනාශ කරගෙන ඇද්දැයි විමසුම් ඇසින බලනවිට අපට පෙනේ. යහපත් වැඩ සඳහා යොදා ගත හැකි කාලය ගුණ දහමින් තොර මිනිසුන් ඇසුරු කිරීම නිසා අයහපත් වැඩවලට පෙළඹේ. රහමෙර පානය, සොරකම, ස්ත්‍රී දූෂණය, වංචා සහගත වැඩවල යෙදීම, ප්‍රාණඝාතය ආදී කටයුතුවලට සහභාගි වීමට සිදු වේ. තමා නොදැනුවත්වම මෙම පාප මිතයන් ඇසුර නිසා ජීවිත පිරිහීම මෙන්ම විනාශ වීම යාමද සිදුවේ. එහෙත් කල්‍යාණ මිත්‍රයන් හෙවත් යහපත් මිත්‍රයන් ඇසුරු කිරීම නිසා යහපත් වැඩවල යෙදීමට මෙන්ම පස-ළවිවලින් වැලකී සිටීමට හැකිවේ. තම ජීවිතය සාර්ථක කර ගැනීමට එවැනි කල්‍යාන මිත්‍රයින්ගෙන් යහපත් උපදෙස් අනුශාසනා මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී උදව් උපකාරද ලැබේ. එවැනි කල්‍යාණ මිත්‍රයින් ඇසුරු කිරීමට යයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ මේ නිසාය.

"අසෙවනාච බාලානං" පණ්ඩිතානංච සේවනා"
යනුවෙන් බුදුරජාණන් වහන්සේ මංගල කරුණු වලින් පළමු කාරණාව වශයෙන් දේශනා කළේද මිනිසාගේ ජීවිතය යහපත් ලෙස ගත කිරීස සඳහා කල්‍යාණ මිත්‍ර සේවනය බෙහෙවින් වැදගත් වන නිසාය.

මී ලඟට තවත් වැදගත් බුදු වදනක් පිළිබඳව සලකා බලමු.

න පරෙසං විලොමානි - න පරෙසං ක.... කථං
අත්තනොව අවෙ කෙඛයා - කථානි අකථානිච

අනුන් ගැන නොසොයන්න. අනුන් කරන නොකරන දෙය ගැන නොසොයන්න. තමා කරන නොකරන දෙය ගැන පමණක් සොයන්න. බලන්න. යනු මේ ගාථාවේ අදහසයි.

අද සමාජය දෙස බලන විට මෙම කරුණු පිළිබඳව සලකා බැලීමේදී සාමාන්‍ය ජනයා තුලා එකිනෙකා කෙරෙහි තරඟ කාරීත්වයක් ඇති වීමට මෙන්ම ඊර්ෂියාව නැමැති පාපී සිතුවිල්ල ඇතිවීම කෙරෙහිතී, අනුන් කරන කියන දෙය අවලෝකනය බලපායි තමාගේ අසල් වැසියන් හෝ ඇසුරු කරන්නත් යමක් කරන විට නිවසක් තනන විට වාහනයක් මිළදී ගත්විට, හෝ වෙනත් ක්‍රියාවලදී එයට වඩා ඉහළින් එම දෙය කිරීමට සිතුවිලි පහළවේ. තමාගේ ශක්ති ප්‍රමාණය ගැන නොසලකා, තරඟකාරීත්වය ඉස්මතුවීම නිසා ආර්ථික වශයෙන් පිරිහීමටද පත්වීමට ද පුළුවන. මෙම තරඟකාරීත්වයෙන් මිදී තමාගේ ජීවිතයේ මෙතෙක් තිබූ අඩුපාඩුකම් මො-නවාද ? තවදුරටත් දියුණුවට පත්වීමට කළ යුතු කාර්‍යයන් මොනවාද ? තව දුරටත් දියුණු කරගත යුතු ගුණ ධර්‍ම කවරේද ? යන්න පිළිබඳව ස්වයං අධ්‍යනයනයක යෙදීම ජීවිතය සාර්ථක කරගැනීමේ පියවරක් වන්නේය.

බුදු රජාණන්වහන්සේ විසින් දේශනා කරන ලද තවත් බුදු වදනක් මෙසේය.

සබ්බේ තසන්ති දණ්ඩස්ස
සබ්බේ භායන්ති මච්චුනො
අත්තානං උපමං කත්වා
නගහෙය්‍ය නඝාතයෙ

සියළු දෙනාම දඬු මුගුරුවලින් තැති ගනිති. සියළු දෙනාම මරණයට භයවෙති. එසේ හෙයින් තමාම උපමාවට ගෙන, අන් අය දඬු මුගුරුවලින් පීඩාවට පත් නොකරන්න. ඝාතනය හෙවත් මරණයට පත් නොකරන්න යනුවෙනි.

අද සමාජය දෙස බලන විට මෙම කරුණ විශාල වශයෙන් දක්නට ලැබේ. සියලු දේශනයන්හි, දේශ සීමා, අරගල, සමාජවල දේශපාලන ප්‍රශ්න, ජාති ආගම්, කුල භේද ආදී කරුණු හේතුකොට ගෙන දඬු, මුගුරු, අවි, ආයුධ පාවිච්චි කිරීමෙන් අත පය කඩා දැමීමෙන් ශාරීරික වධ හිංසා පැමිණවීම මෙන්ම නූතන තාක්ෂණික මෙවලම් හා බලශක්ති භාවිතයෙන් මිනිස් ඝාතන සිදු කිරීම දිනෙන් දින සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. මිනිසුන් පමණක් නොව සත්ව හිංසාවද, සතුන් මැරීමද ඒ ආකාරයටම පවතී. දියුණු මනසක් ඇතියයි කියන මිනිසා විසින් අනෙකා තුල ඇතිවන ශාරීරික මානසික වේදනාව, පීඩාව තමා තුලත් ඇතිවන දෙයක් ලෙස සලකනවා නම්, තමාට මරණ භය ඇතිවීම සංවේදීව සිතනවා නම් තවත් මිනිසකු හෝ සතෙකු මැරීමට වධ හිංසා පැමිණවීමට සිතුවිලි ඇති නොවේ. මිනිසා තවත් මිනිසෙක් පිළිබඳව, සතෙක් පිළිබඳව සංවේදීව සිතනවා නම්, අද ලෝකයේ රටවල් අතර පවතින යුධ කෝලාහල, මිනිස් ඝාතන, සත්ව හිංසා පවතීද එකිනෙකා කෙරෙහි සානුකම්පිතව සිතීමට හැකි-වෙනවා නොවේද ? බුදුරජාණන් වහන්සේ කොතරම් දුරට මෙම කරුණ මිනිස් ප්‍රජාවට පැහැදිලි කොට දේශනා කර තිබේද යන්න නුවණින් විමසා බැලිය යුතුය.

උට්ඨාන වතො සති මතො
සුචි කම්මස්ස නිස ම්ම කාරිනො
සම්ම තස්සච ධම්ම ජීවි නො
අප්ප මත්තස්ස යසොහි වඩ්ඩති

උත්සාහ වන්තව කටයුතු කරන, සිහි කල්පනාවෙන් හෙවත් යෝනිසො මනසිකාරයෙන් යුතු යහපත් වැඩවල නිසි ආකාරව යෙදෙන, යහපත් ලෙස ධාර්මිකව ජීවත්වෙන අප්‍රමාදව වැඩ කරන, පුද්ගලයා දියුණුවට පත්වේ. කීර්තියද වැඩේ යනු මෙම ගාථාවේ අදහසයි.

බුදුරජාණන් වහන්සේ ගුණ ගරුක යහපත් සමා-ජයක් ඇතිවීම සඳහා උපකාරී වන කරුණු කිහිපයක් මෙම ගාථාව මගින් පෙන්වා දී ඇත.

යම් කෙනෙක් තමාට නියමිත කටයුතු උත්සාහවන්තව කරන්නේ නම්, ශීතලය, උෂ්ණය, සාගින්නය, පිපාසාවය, පාන්දරය, මධ්‍යහනය, රාත්‍රියය ආදී කරුණු උදාහරණ වශයෙන් ගෙන කම්මැලිව, නියමිත කටයුතු මගහරින්නේ නම්, අතපසු කරන්නේ නම් ඔහුට ජීවිතයේ දියුණුවක් ඇති නොවේ. සිහි කල්පනාවෙන් යුතුව යහපත් වැඩවල යෙදිය යුතුය. අප්‍රමාදව දැහැමි ලෙස වැඩවල යෙදිය යුතුය. මෙවැනි ගුණාංගවලින් යුතු පුද්ගලයා දියුණුවට පත්වේ ඔහුගේ කීර්තියද වැඩිවේ.

ඉහත සඳහන් ගාථාවලින් දේශණා කළ බුදු වදන් පිළිබඳව නුවණින් සලකා තමාගේ ජීවිත සකස් කර ගැනීමට සියලු දෙනාම උත්සාහ ගන්නේ නම් යහපත් ගුණාංගවලින් යුතු ධාර්මික ජන සමාජයක් බිහිවනු ඒකාන්තය.


## ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ ඔස්ට්‍රේලියානු එකමුතුව

ASWA
Association of Sri Lankan Writers of Australia

**මහා සභාව නොවැ 19 සෙනසුරාදා පෙව 1030 ට**

Noble Park Community Centre
Memorial Drive
Noble Park 3174

**ඔස්ට්‍රේලියාවාසී ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවනට කෙරෙන ආරාධනයයි මේ**

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ලේඛකයන්ගේ එකමුතුව ලෙස Association of Sri Lnkan Wrters of Australia සංවිධානය ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතාගේ මෙහෙයවීම යටතේ පසුගියදා බිහිවිය.

විසිරී සිටන ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවන් එක් තැනකට එක් කර ඒ මගින් විප්‍රවාසී සිංහල සාහිත්‍යයට නව මගක් නිර්මාණය කර ගත යුතුය යන අදහස කාලයක් තිස්සේ සාකච්චාවට බඳුන් වෙමින් තිබුණ ද විවිධ හේතු කාරනා නිසා මේ අදහස මල් ඵල ගන්වා ගන්නට හැකියාවක් නොලැබුණි. කල් යමින් තිබූ ලේකක සංවිධානය පිහිටුවීමේ අදහස මල් ඵල ගැන්වෙන්නේ ප්‍රවීණ ලේඛක ඩී බී කුරුප්පු මහතාගේ හත් වන පොත් එළිදැක්වීමට සමගාමීවය.

සංගමය හරහා සාහිත්‍යගේ ඉදිරි ගමන වෙනුවෙන් විවිධ කාර්ය රැසක් කරන්නට බලාපොරොත්තු වෙයි.
මේ සඳහා ඔස්ට්‍රේලියාවේ වාසය කරන සියලුම ශ්‍රී ලාංකික ලේඛක ලේඛිකාවනට එක්වන ලෙස සංගමය ආරාධනා කරයි.

ඒ සමගම සංගමය හරහා ඉදිරියේදී කළ හැකි සේවා පිළිබඳ ඔවුන්ගේ අදහස් හා යෝජනා ද දැනගන්නට සංගමය කැමැත්තෙන් සිටියි.

වැඩි විස්තර සඳහා පහත දැක්වෙන අංක වලට කතා කරන්න.

වරුණ - 0420 894 942
ජගත් - 0433 438 535